

# ලෙඩ වැඩි කරන ගෝලීය උණුසුම

**අපි අපේ සාගරවල රසායනික සංයුතිය කීපාකාරයකින් ම වෙනස්කරමින් සිටින්නෙමු. එමඟින් ජීවීන්ගේ පැවැත්මට අවශ්‍ය ඔක්සිජන් වායු ප්‍රමාණය හීනවීම නිසා "මළ ප්‍රදේශ" ඇතිවීමට මඟපාදයි. සමහර මෙවැනි මළ ප්‍රදේශවල, මුහුදු ශාඛ බහුලව වැඩෙයි.**

මුහුදු ශාක මෙසේ පිබිදීමට ප්‍රධාන වශයෙන් බලපාන්නේ, වෙරළාසන්න ප්‍රදේශවල සිදුකෙරෙන පරිසර දූෂණය යි. උණුසුම් ජලයේ හටගැනෙන එම පැළෑටිවල වැඩීමට අවශ්‍ය පෝෂණ ද්‍රව්‍ය, පරිසර දූෂණයේ අපද්‍රව්‍යවලින් සැපයේ. මෙකී පරිසර දූෂණය මුළුමනින් ම පාහේ මනුෂ්‍ය ක්‍රියාකාරිත්වයෙන් ඇතිවන්නකි. සමහරවිට මෙකී මුහුදු ශාක විෂ සහිත වේ. ෆ්ලොරීඩා හි රතු උදම (RED TIDE) ඊට එක් උදාහරණයකි. මුහුදු ශාක පිබිදීම බොහෝ කොට ස්වාභාවිකව සිදුවන්නකි. එහෙත් මෑතකාලයක සිට පෙර කිසිවිටෙක නොපැවැති ආකාරයෙන් ඒවා විශාල වශයෙන් වැඩෙන්නේ වෙනත් හේතුවක් නිසා ය.

උතුරු යුරෝපයේ බෝල්ටික් මුහුදෙහි මෙවැනි තත්ත්වයක් උදාවීම නිසා 2005 ගිම්හාන ඍතුවේ (SUMMER) දී එහි පැවැති සංචාරක නිකේතන (TOURIST RESORSTS) බොහෝමයක් වසා දැමීමට සිදුවිය.

දේශගුණය අධික ලෙස උණුසුම් වීමෙන් රෝග වාහක ජීවීහු අලුත් ප්‍රදේශ සොයා සංක්‍රමණය වෙති. සාමාන්‍යයෙන් දේශගුණික තත්ත්වය යහපත්ව පවතින සීත කාලවල දී ලෝකයේ රෝග කාරක විෂබීජ සහ වෛරස් වර්ග මිනිසා ගේ ශරීර සෞඛ්‍යයට හානිකර වන්නේ කලාතුරෙකිනි. සීත කාලගුණය තුළ විෂබීජ අක්‍රීය තත්ත්වයක පවතී. එහෙත් උණුසුම් කාලවලදී ලෙඩ රෝග බෝවීමේ අවදානම බහුල වේ.

මදුරුවා මඟින්, මැලේරියාව, මොළේ උණ, කහ උණ හා බටහිර නයිල් වයිරසය ආදී රෝග කීපයක් ම පැතිරෙයි. ඔවුන් බිත්තර දමා පහසුවෙන් ජීවත්වන්නේ උණුසුම් දේශගුණයක් පවතින කාලවල දී ය. පෘථිවිය උණුසුම්වීම හේතුවෙන් උන් කලින් නොගිය ප්‍රදේශවලට ද ශීඝ්‍රයෙන් ප්‍රවේශ වනු දක්නට ලැබේ.

උදාහරණ වශයෙන් අප්‍රිකාවේ නයිරෝබි නුවර, කෙන්යාවේ අගනුවර, හරාරේ නුවර, සිම්බාබ්වේහි අගනුවර මදුරුවන් බහුලව සිටින තීරුව ලෙස සැලකේ.

පෘථිවිය උණුසුම්වීම මඟින් යුග කීපයක දීර්ඝ කාලයක් තිස්සේ දේශගුණික සෘතු ක්‍රියාවලිය තුළ පැවැති සමබරතාව හෙවත් රිද්මය බිඳී ගොස් තිබේ. ලෝකයේ සමහර පළාත්වල උෂ්ණත්වය හා එය පවතින කාලය ද බෙහෙවින් දික්වී ඇත. එහි අනිවාර්ය ප්‍රතිඵලය වැසි සමය ඉතා කෙටිවීමයි. එහෙත් ඒ අතර ද උෂ්ණත්වය ඉහළ මට්ටමක පවතී. මෙලෙස දේශගුණික සමතුලිතතාව බිඳවැටීම හේතුවෙන් ලෝකයේ බොහෝ ප්‍රදේශවල සතා සර්පයින්ට පමණක් නොව, බෝග වර්ගවලට ද නව අභියෝගයකට මුහුණ පෑමට සිදු විය.

බටහිර නයිල් වයිරසය, 1999 ට පෙර එක්සත් ජනපදය තුළ දක්නට නොලැබිණි. එහෙත් ඊට දෙවසකට පසු එම වයිරසය මිසිසිපි ගඟ(MISSISSIPPI RIVER) තරණය කර තිබේ. අනතුරුව ඊළඟ දෙවසරක් තුළ දී එය මහාද්වීපය පුරා පැතිර ගියේ ය.

එය භයානක රෝගයක් නොවන නමුදු සමහර අවස්ථාවලදී මරණීය උවදුරක්වී ඇත. විද්‍යාඥයන්ගේ මතය අනුව, අස්වාභාවික උණුසුම හා අඩුවැස්ස, 1999 සිට 2003 කාලයේදී මදුරුවන්ට මෙකී විෂබීජ ගෙනයෑමට අවස්ථාව සලසා දී තිබේ.

## සමතුලිතතාව ගිලිහීයෑම

පෘථිවිය උණුසුම්වීම මඟින් යුග කීපයක දීර්ඝ කාලයක් තිස්සේ දේශගුණික සෘතු ක්‍රියාවලිය තුළ පැවැති සමබරතාව හෙවත් රිද්මය බිඳී ගොස් තිබේ. ලෝකයේ සමහර පළාත්වල උෂ්ණත්වය හා එය පවතින කාලය ද බෙහෙවින් දික්වී ඇත. එහි අනිවාර්ය ප්‍රතිඵලය වැසි සමය ඉතා කෙටිවීමයි. එහෙත් ඒ අතර ද උෂ්ණත්වය ඉහළ මට්ටමක පවතී.

මෙලෙස දේශගුණික සමතුලිතතාව බිඳවැටීම හේතුවෙන් ලෝකයේ බොහෝ ප්‍රදේශවල සතා සර්පයින්ට පමණක් නොව, බෝග වර්ගවලට ද නව අභියෝගයකට මුහුණ පෑමට සිදු විය.

ලෝකය පුරා සිටින විවිධ ජීවීන් වඳවීයෑමේ තර්ජනයකට මේ නිසා මුහුණ පා සිටී. මෙය දෙයාකාරයකින් සිදු වේ. එකක් දේශගුණික විපර්යාසය වන අතර, ඒ නිසාම ඒ තුළ සිදුකෙරෙන මිනිස් ක්‍රියාකාකරම් අනෙක වේ.

ඇත්තට ම මේ දෙක එකිනෙකට බැඳුණු එකම ක්‍රියාදාමයක් ලෙසින් ද විස්තර කළ හැකි වේ. උදාහරණයක් වශයෙන් ඇමසෝන්(AMASON) බඳු වැසිවනාන්තරවල ගස්කොළං අසීමිත ලෙස කපා දැමීම මඟින් සතා සිවුපාවන්ගේ සුපුරුදු නිජබිම් උන්ට අහිමි වීමෙන් උන් වඳවීයෑමේ තර්ජනයට මුහුණ දී සිටී. අනික් අතට බිම දමා තිබෙන ගස්කොළංවලින් කාබන්ඩයොක්සයිඩ් වායුව ($CO_2$) වායුගෝලයට නිදහස් කිරීම මඟින් ජීවීන් ගේ පැවැත්මට තර්ජනයක් එල්ල වී ඇත.

එය හඳුන්වා දෙනු ලබන්නේ "සර්පාකාර විනාශ චක්‍රයක්"(SPIRALING CYCLE OF DESTRUCTION) ලෙසට ය.

## ද්වන්ද්ව සටනක්

මෙකල අපි, පෙර නොදුටු "ද්වන්ද්ව සටන" (COLLISION COURSE) කට මුහුණ දී ඇත්තෙමු. මෙම සටන පවතින්නේ ශිෂ්ටාචාරය හා මහ පොළොව අතර යි. අපි මානව සංවර්ධනයේ හා සංස්කෘතික සංවර්ධනයේ නාමයෙන් අපේ ග්‍රහලෝකය නොවැදගත් කුණුගොඩක් බවට පත්කරමින් සිටින්නෙමු. මෙහිදී ප්‍රධාන හා ප්‍රකට කාරණය වී ඇත්තේ විශාල වශයෙන් ජනගහනය වැඩිවීම හා ඔවුන් ප්‍රධාන නගරවලම රාශිභූත වී සිටීමයි.

ලෝකයේ දැනට පවතින ජනගහනය බිලියන 6.5 ක් පමණ වේ. 2050 වනවිට එය බිලියන 9ය ඉක්මවා යනු ඇත. සමහර දියුණු රටවල උපත් වේගය පාලනය කර ගෙන යතත් මරණ අනුපාතය බෙහෙවින් අඩුවී ඇති හෙයින් ජනගහනය ශීඝ්‍රයෙන් වර්ධනය වේ. ලෝකය වටා නගර හා අගනුවරවල අතිමහත් ජනකායක් ජීවත් වෙති. ජපානයේ අගනුවර වන ටෝකියෝ නාගරික ප්‍රදේශය තුළ දස ලක්ෂ 35 ක ජනගහනයක් දක්නට ලැබේ. මෙකී වේගවත් ජනගහන වර්ධනය හේතුවෙන්, ලෝකය පුරා ආහාර, නිවාස, ජලය හා ඉන්ධන වෙනුවෙන් ස්වාභාවික සම්පත් විශාල ප්‍රමාණයක් වාර්ෂිකව පරිභෝජනයට ගැනීමට සිදුවී තිබේ. මෙකී පරිභෝජනය වෙනුවෙන් කැළෑ එළිපෙහෙළි කිරීමෙන් කාබන්ඩයොක්සයිඩ් වායුව වායු ගෝලයට එකතුවනවාට අමතරව, එම වායුව උරාගෙන මිනිසාට හිතකර ඔක්සිජන් වායුව පිටකිරීමට ගහකොළ වලට ඇති අවකාශය ද අවහිර කැරෙයි. සංවර්ධන කාර්යයේ දී මෙකල මිනිසා භාවිත කරනු ලබන නවීන විද්‍යාව හා තාක්ෂණය නිසා ද මහා පරිමාණයෙන් පරිසරය හා ස්වාභාවික සම්පත් දූෂණයට ලක් වේ.

එසේ වන්නේ ඒ දෙක හැමවිටම ඥානාන්විතව හා අරපරෙස්සමෙන් පාවිච්චි නොකරන නිසා ය. සමහර රටවල් හෙළි පෙහෙළි කෙරෙන වනාන්තර වෙනුවට අලුත් වනාන්තර වගා කිරීමට උනන්දුවන නමුත් බොහෝ රටවල එවැනි උනන්දුවක් දක්නට නොලැබේ. හයිටි රාජ්‍යය හා ඩොමිනිකන් ජනරජය මීට කදිම නිදසුනකි. මෙයින් ඩොමිනිකන් රාජ්‍යය වඩා ඥානාන්විත වේ. කලින් පැවැත් එක්සත් සෝවියට් රාජ්‍යය, මධ්‍යම ආසියාවේ විශාල ගංගා දෙකක් නවීන තාක්ෂණය යොදා ගෙන කපුවගාව සඳහා ජලය සැපයීමට දැවැන්ත වාරිමාර්ග පද්ධතියක් ඇති කළේ ය. එහි පැවැති අර්ල් මුහුද (ARAL SEA) ද ජලය ලබා ප්‍රාණවත්ව පැවැතියේ මෙම ගංගා දෙකේ ජලයෙනි. එහෙත් ඉහතකී වාරිමාර්ග පද්ධතියෙන් වාර්ෂිකව විශාල ජලකඳක් පරිභෝජනය කිරීමේ ප්‍රතිඵලය වශයෙන් මෙකල අප දකින්නේ මුළුමනින් ම සිඳීගොස් වැලිකතරක් වී ඇති අර්ල් මුහුදයි. මෙය වැරැදි තාක්ෂණ භාවිතයේ එක් උදාහරණයක් පමණි. විදුලිය, ඉන්ධන හා ලෝහ ආදී නිෂ්පාදන සාධකවල නිෂ්පාදනයේ සිට භාවිතය දක්වා ද මේ තත්ත්වය දක්නට ලැබේ.

මීට අමතරව මෙකල ලෝකයේ බල අරගලය සඳහා න්‍යෂ්ටික බලය නිපදවීම හා එය ප්‍රයෝජනයට ගැනීමෙන් ද යුද්ධය සඳහා බෝම්බ පිපිරවීම නිසා ද වායුගෝලය වේගයෙන් දූෂණය වේ.

මේ අනුව පෘථිවිය උණුසුම්වීමේ අවදානම සංධානයට අවම කර ගැනීම සඳහා ලෝකයේ බොහෝ රටවල් "ක්යෝටෝ සංධානයට" (KYOTO PROTOCOL) ඇතුළත්වී ඒ අනුව කටයුතු කිරීමට පෙළැඹී සිටින නමුත් ඇමරිකාව හා ඕස්ට්‍රේලියාව පමණක් තවමත් එම ගිවිසුම පිළිගෙන නොමැත. කෙසේ වුවද විසි එක්වැනි සියවස අපගේ ශතවර්ෂයයි. එනිසා අපවෙත ලැබී තිබෙන අවස්ථාවන් ප්‍රයෝජනයට ගෙන මෙම අර්බුදය විසඳීමට ක්‍රියාකර පෘථිවිය ප්‍රකෘතිමත් කිරීමට කටයුතු කිරීම අප සතු යුගයේ කාර්යභාරය වේ.

පෘථිවිය අප ගේ එකම නිවසයි. එබැවින් අප එය කෙසේ හෝ ආරක්ෂා කර ගත යුතු වේ.

පරිවර්තනය

**සිරිල් අභයගුණවර්ධන**